# මුවාවී ම

## චූසති ලියනාරච්චි

උඹ උඹේ රහස් මට කියාවියි මං බලාපොරොත්තු ගොඩගහගත්තෙ උඹ හිටපු දිහාවට එන්න මට අවසර ලැබෙන්නටත් කලියෙන්.

බයක් සැකක් නැතුව ඒ දොර දෙකෙන් ඇතුළට ඇවිදින්න බැරි තරම් පුංචි කාලේ, උඹව යන්තමටවත් බලාගන්න කියලා හැම හැන්දෑවෙ මං නහයේ බර තියාගන මීදුම් හුස්ම හෙළද්දී, සුණු විසිණු වෙන්නට තරම් සද්දෙන් වැදුණු මගේ හදවත ඉස්සරහ සීත නිස්සද්ද වීදුරුව ගැහුනෙවත් නැහැ.

පොත් උඩින් මගෙ දිහා බලාගෙන මට විරිත්තාගෙන විහිළු කරද්දිත් ඒක උඹ දැනං උන්නා නේද? මගේ බෙල්ල අග්ගිස්සේ තිබ්බ රෝම කූප හිතං උන්නේ උං මටත් වඩා උඹව දන්නවායි කියලා.

ඒ මායිම පනින්න තරම් මගේ හිතේ හයියක් තිබ්බේ නැහැ.

මේ සිද්ධිය වෙද්දි මට අවුරුදු නවයයි.
අය්යත් එක්ක රණ්ඩු වෙලා අහුවෙච්ච මං කොහෙද කියලා හැමෝම හොය හොය උන්නු නිසා මට ඕනේ වෙලා තිබ්බේ හැංගෙන්න තැනක්.

සත්තයි! උඹෙ දොර අරින්න තරම් හිතේ හයියක් මට නොතිබ්ච්ච බව.
ඒත් වේවැලේ දෝංකාරය ඇහෙද්දී වෙන කරගන්න දෙයක් තිබ්බේ නෑ. මට උවමනා වුණේ හැංගෙන්න.
මං හිතුවා ඒ වෙනුවට ඕක ඇතුළේ උඹට බිලිවෙන එක හොඳයි කියලා.
තාත්තා මට කියලා තිබ්බ කතාවල හැටියට මං පොත්කාමරේම හැංගෙයි කියලා එයා කවදාවත් හිතන්නැති වේවි. එයා දැකලා තියෙනවලු උඹ පුංචි ළමයි

දෙන්නෙක් සම්පූර්ණෙන්ම ගිලලා දාන හැටි, උන්ගෙ කකුල් උඹේ කටින් එල්ලි එල්ලී දෙපැත්තට වැනි වැනී තියෙද්දිම!

වෙව්ල වෙව්ල, ඇද වැටි වැටි, පැකිලි පැකිලි, බයෙන් බකලගැසුණු හදවතටත් වැඩියෙන් දුර්වල දණිස් දෙකකට වාරු දීගෙන මං ඒ සීමාව පැන්නා.

ඇතුළ හරි අන්ධකාරයි—ඒත් ඒ අන්ධකාරය, පැනලා දුවන්නයි කියලා මට අඟවපු එකක් නම් නෙමෙයි.
හරි සීරුවට, සැහැල්ලුවට මම ඇඟිලිතුඩුවලින් ඇවිද්දා. ඒ නිහඬකමට කන්අඩි කීතු කීතු වෙන තරම්!
මගේ ඇස්වලට මග හොයාගන්නට තරම් එළියක් පොත්කාමරේ තිබ්බේ නැතත්, උඹ ඉන්න තැන ඉවෙන් වගේ දැනගන්න තරම් අනන්තවාරයක්වත් මං උඹ දිහා බලං ඉඳලා තියෙනවා.

*රාක්ක තුනක්, දකුණට.*
වෙව්ලන ඇඟිලි තුඩු එක්ක ඔච්චම් කරන පේළි ගැසුණු උස් රළු නොසැලෙන පොත්වල කොඳු කළුවරෙත් මට දැනුණා.
*රාක්ක තුනක්, දකුණට.*
ඉතින් හුස්ම හිරකරං වෙව්ලන බිත්තියට වත්තන් වී ගෙන, ඇඟිලිතුඩුවලින් කාමරේ එහා කොනට යන ගමන් මං ගණිනවා.
මං උඹෙ ලැගුම්හල අස්සෙ උඹව දකින පළමු මොහොතේ මගෙ හදවත සුණු විසුණු වෙලා යන්නේ බෙරපද දාහක තරම් මහා හඬක් නගාගෙන.
උඹට මාව ඇහෙනවා! ඇහිලා මං දිහාවට හැරෙනවා!
තිගැස්සිලා කෑ ගහන මං අත පය හතර මත ඇද වැටිලා, හතරවෙනි පොත් රාක්කෙ පිටිපස්සට බඩගානවා.
වෙව්ලන කුතුහලයකින් මං කකියන්නේ උඹේ සේයාවක්වත් දැකගන්න.

*ඒකාගේ ඉස්සරහට පලයන්*
මගේ ඔළුව අස්සේ කටහඬක් කියවනවා.

මගේ ඇස් දෙකත් කළුවරේ උඹව ටික ටික හොයනවා.
උඹට මෙච්චර යකා නගිනවා නම් මම දැකලම නැහැ!

ගිනියම් දෑස්. මට දැනෙනවා උඹ දත් විරිත්තාගෙන මං දිහා හැරෙන හැටි—උඹෙ මූණෙන් බාගයක් අඩ එළියක අතුරුදන් වෙලා, ඉතිරි බාගේ මගේ ගොර ගොර ගාන බඩ පෙනහලු දිහාවට ඇදගෙන යනවා.

*ඒකාගේ ඉස්සරහට පලයන්.*

හුස්මක් ඇදගත්තු මම වෙව්ලන්නේ අලුත් තරහකින් මත්වෙලා.
ඒක ලේ නටවන, සිහි අමතක කරවන තරහක්.
නොහිතාම තාත්තාගේ බර හාන්සිපුටුව උස්සගත්තු මම ඒක අමාරුවෙන් වත්තන් කරගෙන ගැටුවේ උඹේ පොත් රාක්කෙ දිහාවට. දෙපා නැවත පොළොවේ වැදුණ පුටුවත් එකම එක වරක් කෙඳිරිගානවා. ඒක උඩට මං නගින්නේ, මට හුරුපුරුදු ඒ නිස්සද්දකමින්මයි.

ඉතින් ඊට පස්සේ අපි හිටං උන්නා ඒ කළුවරේ. කෙල්ලයි, යකයි.

උඹෙ මූණේ පහස පළවෙනි වතාවට ලබන මගෙ ඇඟිලි වෙව්ලනවා. උඹෙ වක ගැහුණු නහය, එළියට නෙරා ආපු ඇස්ගෙඩි මතින් මං ඒ ඇඟිලිතුඩු යවනවා.
එතකොට උඹෙ පහස ලැබිච්ච තැන්වල මං පිච්චි පිච්චී ගිනියම් වෙනවා.
උඹ මං දිහා බලාගෙන විරිත්තද්දී උඹව පේන්නේ හරියට ලොකු වේදනාවකින් නැත්තං ආස්වාදයකින් පීඩාවෙච්ච කෙනෙක් වගෙයි. ඒත් මේවා හිතන්න තරම් ඒ වෙද්දි මං වයසින් මුහුකුරා ගිහිං නෑ.

ඉතිං මං මට හිතුණු හිතුණු දේ උඹට කරන්නට හිතුවා.
දැන් තිත්තයාගේ වාරයයි.
හරවනවා මම—උඹව හරවනවා! කාලයේ දුහුවිලි හා මකුළුදැල් මගේ ගවුම් වාටියෙන් ගසාබසා දාලා, මගෙ මූණට තියාගෙන, උඹට මං මත්තෙම, නැත්තං මට, උඹ මත්තෙම, වැඩෙන්න ඉඩ ඇරියා.
මට දැනෙනවා මගෙ අත් යට උඹෙ හුස්ම තදවෙනවා, මගේ මූණ මත.
ඉතින් විරිත්තනවා මං, යකාගේ විරිත්තිල්ලටත් යටින්.
*උඹ කැමැති ද ඒකට?* අහනවා මං උඹෙන්.
උඹ වෙව්ලන්නේ හරියට නිස්සද්දකම වගේ.

මං මගේ රාජධානිය පිරික්සන්නේ උඹව මගෙ මූණට වත්තන් කරං ඉඳගෙන. මේ පොත් අතරින් ඉවත් වෙන්නට මට අණ කරන්නට දැං කාටවත්ම බැහැ.
අලුත් පුරුද්දක්.
උඹෙයි මගෙයි.
යකාගෙයි මගෙයි.
*මොන යකෙක් ද මං?*

***

***උගන්නෙමි දවාලට ගෙය නිස්සද්දවන වේලාව.***
***උගන්නෙමි යතුර හරවන විට සද්ද නොනගන්න.***
***උගන්නෙමි නුඹට මට හුරුවන්නට ඉඩ අරින්නට.***

***උගන්නෙමි කතා කරනට.***

***උගන්නෙමි ආලය කරනට.***

*උගන්නෙමි නුඹ බලා ඉද්දීම, නුඹෙ දෑස් ඉස්සරහම, කලෙක මම-ම වූ කැබලි මගේ සමටත් යටින් බඩගාගෙන ලොව වෙත එන අපූරුව. ඔව්, දැන් වෙනස් නුඹෙ දෑස්. නුඹට තිබේවියි නුඹ නොසිතූ සෙනෙහෙවන්ත කමක් දෝරේ ගිහිං.*

***

*ඔහුගෙන් පසුව මම කියවීමට නැඹුරු වී ඇතැයි මම සිතමි.*
*කියවීමේ ආසාව මට නිතර තිබුණු එකක් වුවත්, ඔහු සමග කාලය ගත කරන මට වුවමනා වූයේ ඔහුගේ ලෝකය දැනගන්නටයි. මට එතැන පෙනුණේ ඔහුගේ පොත්ගුල, ඔහුගේ පොත් ලෙසයි.*
*ඒ පොත්වල අග්ගිසි ගෙන ආ පහස රළු වුවත් හරවන හැම පිටුවක් ගානෙම දැනුණේ ඒවායේ ඇතුළත වූ මෙළෙක් බවයි.*
*කාලෙන් කාලෙට එතැන හිඳියෙමි මම, හැන්දෑවක් පාසා අත්ලට දාඩිය ගෙනෙන අඳුරෙහි ගිලීගෙන, සිත පිටු අතර ලිස්සා ගිය කලෙක, දැනුම යැද යැද.*

***

මට වුවමනාව තිබ්බේ උඹව දැනගන්නයි.
මට වුවමනාව තිබ්බේ උඹ මාව දැනගන්නවාටයි.

ඉතින් ඇල්පෙනෙති තුඩක සද්දයක්වත් නොකර කළුවරේ ඉඳං උන්නා මං. රහසේ කියව කියව, එකොළොස් හැවිරිදි කෙල්ලකට තරම් නොවූ රහස් කියව කියව.

*දොළොස්වෙනි විය වන විට මම කණුවකට බැඳ දැමුණු නිරුවත් ගැහැනියක දැක ඇත්තෙමි. ඇගේ රෝස පැහැ තන පුඩු තුළට ලණු කැපී යයි. එළියේ වරුසාවක්. තෙත වැහි පොද සල්ලාල වීදුරුව මතට තදින් ඇද වැටෙයි.*

***අවුරුදු දහසයේ දී මම, ඒ ගැහැනිය උන් තැනම මාව දකින්නෙමි—ගසකට බැඳ දැමුණු මට නුඹ කවි කියවන අපූරුව!***

***

දහඅටේ දී මං උඹ දකින්නේ එක්තරා කොල්ලෙකුගේ හදවත කඩාදමන්නට මා ඔහුගේ නිවසට ගිය විටයි. උඹ උන්නේ ඔහුගේ බිත්තිය මතයි.

හැබැයි උඹෙ නාහේ එතකොට පොඩ්ඩක් දිගයි. අං නැහැ.

එක්තරා ආකාරෙක විදග්ධ බවක් උඹෙ මූණෙන් කියැවුණා. වෙස්වලාගත්තු යකෙක්.

ඒ කොල්ලව අතහැර දාලා යන්නට කලියෙන් මම කිව්වා මං ඔහු ඔහුගේ වෙස්මුහුණ වීසි කර දමන තුරු බලං උන්නු බව.
ඔහුට මං එදා කියූ දේ තේරුණා දැයි මම තවමත් දන්නේ නෑ.

***

වයස විසි එකේදී මා ආලයෙන් වෙළී උන්නු කොල්ලෙක් උඹෙ මූණ තරම්ම රතුපාට බහින ඉරකට මාත් එක්ක යනවා. ඔහු වෙනත් ගැහැනියක් සමග හිඳීම ගැන සිතීම පවා මගෙ මුහුණ රතු කර දමනවා. කොච්චර රතු ද කියතොත් ඔහු දැං දැං මට අං එතියි කියමින් මට සිනාසෙනවා.
එකම කවිය ආයෙ ආයෙ කියව කියව නොඉවසිල්ලෙන් උන්නු කාලේ උඹ මට ඉවසන්න කියා දුන්නා නම් කියා මට හිතුණා.
නවාතැන්ගත්තා ඔහුගේ අත මගේ උකුළ මත.
මගෙ රත හොඳ අතට හැරුණා.

මං දිහා බලං ඔහු මට කතා කළේ 'ආදරය' කියලයි.

***

*ගෙදරින් පිටමං වී මා යන දිනයේ, මා නුඹ දෙස නැවතත් බලමි.*
*කාලෙත් එක්ක නුඹත් ගෙවී ගිහිං.*
*දැන් නුඹ දැක්කට බයක් නොදැනෙන ගානයි.*

*එහෙත් නුඹ හැර දමාගියායින් පස්සෙත් හුග කාලෙකට මට නුඹ නැති පාළුව දැනෙයි.*
*සෙනග පිරුණු කාමරයක ඉන්නා විට එක්වරම මට නුඹ නැති පාළුව දැනෙයි.*
*එවිට එළිය නැතිවී යන්නට කියා පතමි.*
*ඉන් පසුව මම නුඹයි මමයි අපේ පොතුයි පමණක් උන්නු කාලේ ගැන සිතන්නෙමි.*

***

උඹ ආයේ මං ළඟට එන්නේ මං නොහිතපු වෙලාවක. ගෙදරින් සැතපුම් දහස් ගණනක් දුර පුස්තකාලෙක උන්නු නාඳුනන එකියකගේ ගෙල පිටිපස්සේ ඉඳලයි උඹ මා වෙත කඩා පනින්නේ.

උඹ ඕනෑකමින් උන්නේ මං ආයෙමත් උඹ එක්ක ඉඳං කියවන්න එනකං. අතහැර දමා යන්නට බයවුණු දේ ගැන මං නුඹට කියවාවි යි කියලත් උඹ බලං උන්නා.
ඈ මං ඉස්සරහා ඇගේ සළු උනාදාද්දී උඹව දැක්කම මගෙ දෙතොල් පවා වෙව්ලුවා. මගේ ඇඟිලි උඹව අල්ලන්න බයෙන් උඹ වෙත ඇදෙද්දි සුසුමක් හෙළපු ඈ ඉවතට හැරුණා.
උඹ ආයෙමත් මං ළඟටම ඇවිත්.

*කොහොම ද, ඉතිං ?*

උඹ හුඟක් වෙනස්වෙලා වගේ නේ. මං මේ පාර උඹව එකපාරම හඳුනගන්නේ උඹෙ මූණේ තිබිච්ච ඒ රතු පාටින්. ඒත් දැන් උඹෙ හිනාව වෙනස්.
හරියට ලොකු වේදනාවකින් වගේ. පෙනුණේ උඹ කැළැල් හංගං ඉන්නවා වගේ.

ඈ ස්පර්ශ කරද්දී, ඇගේ අකු ඇට මත මගේ දිව ගෙනයද්දී, ඇගේ කන්පෙත්ත තොල් අතරට ගනිද්දී මට දැනුණා උඹ මගේ අත්ල යට ගිනියම් වුණු බව.

***බැගෑපත් වූවා නුඹ. බැගෑපත් වූවා අයෙමත් ඇවිදින් නුඹත් එක්ක ඉඳගන්නයි කියා.***
***කියවන්න. කියවන්න මට නුඹ අතහැර දමා යන්නට බයවුණු දේ ගැන.***

'ලයිට් එක ඕෆ් කරන්න' යි මම ඇයට කියමි.
'බැහැ, මම කැමති ඔයාට මාව පේනවට.'
'ඒත් මට කළුවරේ පාර හොඳට පුරුදුයි' මම කියමි.
එක මොහොතකට අපි නිහඬවම එකිනෙකාගේ දෑස් තුළට එබීගෙන උන්නෙමු.
'අනෙක් පැත්තට හැරෙන්න' මම ඇයට කියමි.
ඇඟිලි තුඩුවලින් ඇගේ සම මත නුඹ අඳිනෙමි. මගෙ ඇඟිලිවල නුඹව ගෑවුණු තැන් හෙමි හෙමින් ගිනියම් වෙයි.

***බොහෝ කලකින් පළමුවරට මං නුඹෙ පහස ලබද්දී, පැරණි රිදුම් හමුවේ මගේ දෑස කඳුළු පිරී දැවෙයි.***

'ආයෙමත් අල්ලන්නකෝ මාව,' ඇය කොඳුරයි.
මා ඇය අල්ලන්නේ නුඹව අල්ලන්නටැයි ඈ නොදනී.

***තෙහෙට්ටු වූ මම, නුඹ මට වරක් කියූ කවියක් මුමුණමින්, ඇගෙන් ඉවතට හැරී ඇගේ ගෙල මත හුන් නුඹ මත ඇඟිලි තුඩු යවමි.***

මවෙත හැරුණු ඇය මගේ මුහුණ පිරිමදිමින්, 'ඔයා වයසට ගිහින්' කියයි.
'ඔයා මාව දැනගත්තෙත් අද උදේ නේ,' මං හිනාවෙවී කියමි.
'ඔව්, ඒත් ඔයා වයසට ගිහිං.'

ඉවතට හැරී මම ඇගේ කොට්ටයේ මුහුණ හොවාගෙන සියුම් හඬින් හඬමි.
ගෙදර නැති අඩුව මට දැනේ.

මට ආයෙමත් අවුරුදු එකොළහයි.
අහුවෙලා! උඹත් එක්ක අඳුරේ අතපතගාද්දී අහුවෙලා!
රතු වෙච්ච, තෙත් වෙච්ච අත් එක්කම.
හොයාගෙන ඔවුන් උඹ එක්ක මං උන්නු කොන.
මම මගේ පුටුව උඩ, උඹ මගේ දෙපා ළඟ පොළොව මත.
මගේ වම් අතේ අර ගැහැනිය උන්නු කළු පොඩි පොත.
මං ඇඳන් උන්නු ගවුම අස්සෙයි දකුණු අත.
මම කුමක් කරමින් උන්නා දැයි නොදනිමි.
එහෙත් මට හොඳ පදමට ගුටි ලැබෙයි.
ආයේ කවදාවත් මං මාව ඇල්ලිය නොයුතු ය!
ඒක නොමනා, නරක වැඩක් යැයි අම්මා මට කියයි.
එසේ කියා ඇය අපේ පොතට ගිනි තියයි.

මං මිදුලට වී ඔංචිල්ලාවේ හිඳ හැඬුවේ නුඹට කුමක් වුණා දැයි නොදන්නා බැවිණි.

***නුඹව පොත් ගුලෙන් පිටතට ගන්නට ඔවුන් තීරණය කර ඇත.***
***නුඹ දැන් ඉන්නේ සාලේ මැද, ගිනි දහවල් එළිය වැටෙන තැනක.***

***බිත්තියකට ඇණ ගහපු නුඹ, දැං හැමෝටම පේන තැනක.***
***ගිනි දහවල් එළිය වැටෙන තැනක.***
***සමහර වෙලාවට යනඑන අතරතුර නුඹ මට***
***මං දිහා බලන්නැ යි කියා සිටියත්***
***දෑස් බිම හෙළාගෙන මම නුඹ අසළින් ඉවත්වී පලා යමි.***
***මට හිතුණේ නුඹ දැන් ඔවුන්ගෙයි කියලයි.***
***දරාගත නොහැකි තරම් එළියක් නුඹෙ මුහුණ මතට වැටුණු කල, බිත්තිය මත වූ නුඹ වේදනාවෙන් විරිත්තයි.***
***මමත් විරිත්තමි බිත්තිවලට කොටුවී, මගේ මුහුණ මතට දරාගත නොහැකි තරම් එළිය වැටුණු කලට.***
***මට නුඹ අසළට වී හිඳගෙන කියවන්නට තරම් හෙවනක් තිබුණේ ද නැත.***

***

වයස විසිතුනේ දී මම, වැනීසියේ නුඹව සොයන්නෙමි.

වෙස්මුහුණක් වීය මගේ මුහුණ මතත්. යටපත් කරගත් වේදනාව සඟවාගන්නට හැකි තරම් පළල් වූ හිනාවක් දරාගෙන.
වේලාව දොළහට කාලයි, මං උන්නේ බෝට්ටුවක.

ඒත් මං හිතිං උන්නේ අපේ පොත් පිරුණු පුංචි කාමරේ, උඹත් එක්ක තනියම.
උඹ මට කවි කියවනවා.
එහෙත් උඹ... උඹ දැං හුඟක් ඈතයි, අපිට අපිවම මගහැරිලා ගිහිං.
උඹෙ මූණේ පහස පවා මගේ අත්වලට දැනෙන්නේ නැතුව ගිහිං.
එහෙත් මං ගෙනිච්චා උඹව මගෙ හදවත අස්සේ.
අපි මුලින්ම හමුවෙච්ච දවසේ මගේ අතේ තිබ්ච්ච එකම එක පොතකුත් මං මා එක්ක ගෙනිච්චා.

මට මතකයි ඒක කොච්චර පූජනීයයි ද කියලා.
කියවීම, පැළඳ ගැනීම, උනා දැමීම අපි යාතුකර්මයක් කරගත්ත හැටි.
සීතල දිය රැළි බෝට්ටු කඳ සිපගද්දී, මගේ හිත සිපගත්තේ නුඹ ගැන සිතිවිලියි.

සඟවා ගතිමි මං මගේ කඳුළු බිඳු.

***

*තවමත් විසිතුනයි. ආයෙමත් ගෙදර මම.*
*වැනීසියෙන් වෙස්මූණකුත් අරං ආවා මං එක්ක.*
*තාත්තට කිව්වා මට ඒක එල්ලන්න ඕනෙයි කියලා බිත්තියේ උඹව එල්ලලා උන්නු තැනම.*

***නැවත නුඹෙ පහස ලබමි මම, මගෙ අත්ලට යටින් රළු ගොරහැඩි ඉරි තැළුණු නුඹ. නුඹ හිතයි මේ වෙද්දී මට අමතක වෙලත් ඇතියි කියලා, එහෙත් ලීයට යටින් නුඹ ඉන්න තැන කියන්නට මම තවමත් දන්නවා.***

*'උඹ වයසට ගිහිං,' නුඹ මට කියයි.*
*උඹේ රතු මුහුණ පිරිමැද්දා මං. පොඩ්ඩක්වත් වෙනස්වෙලා නෑ නේ උඹ.*
උඹව බිත්තියෙන් ගලවලා දැම්මාට පස්සෙ ඔවුන් අලුත් වෙස්මූණ අගය කරනවා.

'මං මේක ගන්න ද?' තාත්තාගෙන් ඇසුවෙමි.
ඔහු හිස වනයි.

***ගෙනයමි නුඹ නැවතත්***
***මෙවර මගෙ කාමරයට***

*කොනක වූ පොත් රාක්කය මතට ඇරුණු ජනේලයෙන් හැලුණු ආලෝකය පතිතවෙයි. හුග කාලෙකින් අල්ලලාවත් නැති මා එක්ක හැදුණු වැඩුණු පොත් දඟකාර ලෙස අප දිහා බලයි.*

*මතකද?*

මට මතකයි, බාගෙට එළිය වැටුණු  කාමරේක කොනක ඉඳගත්තු අපි.
දැන් වැටෙන ආලෝකය පවා වෙනස්.
මේසේ කොනක උඹව තියලා, උඹ කියන්නටත් කලියෙන්, පුරුද්දටම වගේ මං උඹට කියවන්න පොතක් ගත්තා මගෙ මල්ලෙන් එළියට.

*'උඹ තවමත් ඒකි ගැන හිතනව ද?'* උඹ ඇහුවා මගෙන්.
හිස වැනුවා මං.

***කියවන්නෙමි නුඹට මා ලියූ වදන් අතරින් යමක්—***
***නුඹ දැන් දැන් සිනාසෙයි, බරක් සැහැල්ලු වූවා වගේ, හරිබරි ගැහී මගෙ වදන් අසාගෙන.***

***පසාරු කරන දැස්වලින් මදෙස බලන නුඹේ මුවග සිනහවක් නලියයි.***
***ඉන්පසුව හෙමි හෙමින් නුඹ මෙහෙම කොඳුරයි:***

*උඹ, උඹව ම අල්ලන්න අලුත් විදියක් හොයාගෙන නේ ද?*